සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

43 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය .............................

ක්‍රිස්තු ධර්මය I

කාලය පැය දෙකයි

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4). (5) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කරන්න.**

(1) (1) ශුද්ධ වූ බයිබලයේ වාචික සම්ප්‍රදායන්ගෙන් ඉදිරිපත් කරනුයේ
1. ජනවහරේ සිද්ධීන් වල එකතුවක් ය.
2. තෝරාගත් ජනතාවගේ අත්දැකීම් ය.
3. ලිඛිත මාධ්‍ය නොවැදගත් බව ය.
4. මුල් යුගයේ සාක්ෂරතාවයේ නොහැකියාව ය
5. කතාන්තර ශෛලියෙන් ලාබාලයින් දැනුවත් කිරීම ය.

(2) මැසරොටික් පිටපත සඳහා වෙනත් වචනයක් වන්නේ
1. හේබ්‍රෙව් පිටපත ය. 2. ග්‍රීක පිටපත ය. 3. ලතින් පිටපත ය.
4. ඇරමයික් පිටපත ය. 5. සෙප්ටුවාජින්ත පිටපත ය.

(3) ගලීලයට දකුණෙන් ද ජුදෙයාවට උතුරින්ද පිහිටියේය. කඳුකර ප්‍රදේශයක් වුවත් එහි සාරවත් මිටියාවත් කීපයක් තිබිණි. ඔවුන් අන්‍යජාතිකයන් හා මිශ්‍ර වූ ජනතාවකි. මෙහි ඇති විස්තරය ගැලපෙන්නේ කුමන භූගෝලීය කලාපයක් සඳහාද?
1. ඉහළ ගලීලය 2. පහළ ගලීලය 3. සමාරිය
4. ජුදෙයාව 5. පෙරයාව

(4) යාවේ දෙවියන් වහන්සේට අයත්ව තිබූ පැරණි වන්දනා ස්ථාන නවීකරණය කළේ
1. සලමොන් රජතුමා ය. 2. දාවිත් රජතුමා ය. 3. සාවුල් රජතුමා ය.
4. ජෙරබොවාන් රජතුමා ය. 5. රෙහෙබොවාන් රජතුමා ය.

(5) අපර විප්‍රවාසී යුගයේ දී ජුදා ජනතාව නැවත විනය ගරුක ජනතාවක් කිරීමට මූලික වූ නීතිවේදියා වන්නේ
1. එසකියෙල් ය. 2. එස්රා ය 3. සාමුවෙල් ය.
4. ඒලි ය. 5. එස්තර් ය.

(6) පහත දැක්වෙන ලක්ෂණ වලට අදාල සම්ප්‍රදායන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

- දේව මාලිගාව තුළ පමණක්ම දේව වන්දනාව සිදුවිය යුතුබව දක්වයි.
- දෙවියන්වහන්සේව මානව රූපාකාරයෙන් ඉදිරිපත් කරයි.
- කූඩාරම් හෝ දේව මාලිගාව දෙවියන් වැඩසිටින තැන් නොව දේව බලය ප්‍රකාශ වන තැන ලෙස දක්වයි.
- සිහින, දූතයන් මගින් පමණක් මිනිසාට කතාකරන උත්කෘෂ්ට තැනැත්තෙකු ලෙස දෙවියන්ව දක්වයි.

1. P,J,E,D 2. J,P,D,E 3. D,J,E,P 4. D,J,P,E 5. E,J,D,P

(7) හීබෲ බසින් "රාදා" යන වචනයෙන් කියවෙන්නේ

1. යටත්කර ගැනීම ය. 2. රැකබලා ගැනීම ය. 3. බලයට නතුකර ගැනීම ය.
4. අණසක පැතිරවීම ය. 5. අයිතිය හැඟවීම ය.

(8) මිසරයේ සිදුවූ පීඩන තුළින් ප්‍රකාශ වූයේ

1. යාවේ දෙවියන් වහන්සේගේ ආදිපත්‍යයයි. 4. ඉන්ද්‍රජාලිකයන් පරාජය වූ බවයි.
2. සියළුම පීඩා සොබාව ධර්මයේ හේතූන් බවයි. 5. මෝසෙස්ගේ බලගතු බවයි.
3. පාරාවෝ ලැජ්ජාවට පත්වූ බවයි.

(9) උත්පත්ති පොතේ සඳහන් මැවීමේ දෙවන කතා පුවතට අනුව විශ්වයේ කේන්ද්‍රය ලෙස දැක්වෙන්නේ

1. භූමියයි. 2. ජීවන වෘක්ෂයයි. 3. මිනිසායි.
4. ඒදන් උයනයි. 5. ඉෂ් හා ඉෂ්ෂායි.

(10) මැවීම පිළිබඳ පළමු කතාවට අයත් ලක්ෂණයකි.

1. දෙවියන් වහන්සේව මිනිසාට සමීප කර දැක්වීම 2. පුනරුච්චාරණ ශෛලියක් භාවිත කිරීම
3. කථාන්තර ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම 4. පොළවේ දූවිල්ලෙන් මිනිසා මැවීම
5. දෙවියන් වහන්සේව මානව රූපකාරයෙන් ඉදිරිපත් කිරීම

(11) සීනායි ගිවිසුම ස්ථිර කිරීමේදී අදියර දෙකකින් සිදු කරනු ලබයි. මෙහිදී පුරාණ ගිවිසුමේ සඳහන් " බොඳුන" යන වචනයයෙන් සංකේතවත් කරන්නේ

1. බෙදාගැනීම හා ප්‍රේමයයි. 2. එකමුතුකම හා පරිත්‍යාගයයි.
3. ප්‍රේමය හා සාමූහික බවයි. 4. සාමූහිකත්වය හා සහජීවනයයි.
5. පරිත්‍යාගය හා සහජීවනයයි

(12) ඊශ්‍රායෙල් ගැලවීම ඉතිහාසයේ දිවැසිවරුන්ගේ ප්‍රධාන කාර්යය වූයේ

1. ඊශ්‍රායෙල් ජනතාව ඉදිරියේ දී සිදුවන්නට යන දේ ප්‍රකාශ කිරීම ය.
2. ගිවිසුම් ජීවිතයෙන් බැහැර වන ඊශ්‍රයෙල් වරුන් නැවත ගිවිසුමට පත් කරවීම ය.
3. දේව පුත්‍රයා මෙලොවට වඩින්න සූදානම් බව ඊශ්‍රායෙල් ජනතාවට ප්‍රකාශ කිරීම ය.
4. ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ කැමැත්ත පෙන්වා දීම ය.
5. පාළුකරයේ ගමන් කළ ඊශ්‍රායෙල් ජනතාවට දිව්‍ය සංරක්ෂණය පෙන්වා දීම ය.

(13) යෙසායා දිවැසිවරයා කැඳවීම ලද මොහොතේ ඔහුගේ පාපිෂ්ඨබවත් අපවිත්‍ර බවත් ප්‍රකාශ කළ විට ඔහුගේ පව් කමා කළේ

1. ඔහුගේ බැහැපත් යැදුමට සවන් දුන් මොහොතේදී ය.
2. විප්‍රවාස ගතවූ කාලයේ දී ය.
3. ඔහු දර්ශනය දුටු අවස්ථාවේ දී ය.
4. මුඛය ස්පර්ෂ කිරීමේ දී ය.
5. පූජාසනය මත තිබූ ගිනි අඟුරු කැබැල්ලකින් තොල් පවිත්‍ර කිරීමේදී ය.

(14) සෙනඟගේ පාපද මිත්‍යා ඇදහිල්ල ද චපල විශ්වාසය ද නිසා ජාතියට පැමිණෙන්නට යන මහා විපත්තිය ගැන අනතුරු ඇඟවූ දිවැසිවරයා වූයේ

1. ජෙරමියා ය. 2. ආමොස් ය. 3. එසකියල් ය. 4. යෙසාය ය. 5. මීකා ය.

(15) දිවැසිවරු ඉගැන්වූ ගිවිසුම් ජීවිතය පිළිබඳ ඉගැන්වීම් අතරින් "මිදිවත්ත හා වැවිලිකරු" (යෙසායා 5/1-7) යන සම්බන්ධතාවෙන් "මිදිවැල්" සංකේතවත් කරන්නේ කුමකට ද?

1. ඊශ්‍රයෙල් වංශයට ය. 2. අන්‍ය ජාතීන්ට ය. 3. ජුදා සෙනඟට ය.
4. මිදි යුෂවලට ය. 5. ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරයට ය.

(16) පලස්තීන සමාජයේ පීඩිතයන්ගේ පීඩිතයන් ලෙස හඳුන්වනු ලැබුවේ

1. අයකැමියන් ය. 2. රෝගීන් ය. 3. වෛශ්‍යාවන් ය.
4. පව්කාරයන් ය. 5. වැන්දඹුවන් ය.

(17) ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ සැන්හේඩ්‍රින් සභා නායකයන් දෙපළක් වූයේ

1. පිලාත් හා හෙරොද් ය. 4. සීසර් හා පිලාත් ය.
2. පාවුළු හා බර්ණබස් ය. 5. ජුදාස් හා ජෝශප් ය.
3. අන්නාස් හා කයිපාස් ය.

(18) රාත්‍රී භෝජනය පිළිබඳ දේශනා කිරීමේ දී තමන් ජේසුස් වහන්සේගෙන් ලබාගත් දේ ප්‍රකාශ කරනබ බව පාවුළු තුමා පවසනුයේ

1. කොලොස්සි සංඝයට ය. 4. පිලිප්පි සංඝයට ය.
2. කොරින්ති සංඝයට ය. 5. එපීස සංඝයය ය.
3. ගලාති සංඝයට ය.

(19) ශුද්ධ වූ මාක්තුමා තම සුබාරංචිය සඳහා ප්‍රධාන මූලාශ්‍රය කරගනු ලැබුවේ

1. ජේදුරුතුමාගේ දේශනා හා ඉගැන්වීම් ය. 4. දේවමාතාවගෙන් අසා දැනගත් තොරතුරුය
2. පාවුළුතුමාගේ දේශනා හා ඉගැන්වීම් ය. 5. අන්‍යජාතිකයන්ගේ අත්දැකීම් හා තොරතුරුය.
3. මතෙව්තුමාගේ දේශනා හා ඉගැන්වීම් ය.

(20) සුභාරංචි කර්තෘ ශුද්ධ වූ ජුවාම් තුමාගේ පියා වන්නේ

1. හේළි ය. 2. සකරියස් ය. 3. සෙබදි ය. 4. නතානියෙල් ය. 5. ජෝනා ය.

(21) ජේසුස් වහන්සේ තමා පිළිබඳ සත්‍ය තොරතුරු හෙළි කිරීම ප්‍රතික්ෂේප කළ බව පවසා ඇත්තේ

1. විල් හෙල්ම් රීඩ් ය. 4. ශු. ක්ලෙමෙන්ට් තුමා ය.
2. ජුලියස් වෙල්හවුසන් ය. 5. ජෝර්ජ් මාරියෝ ය.
3. සිප්‍රියන් පියතුමා ය.

(22) ක්‍රිස්තුන් වහන්සේ ගෙත්සෙමනියේ දී දැඩි මානසික වේදනාවට පත් වීමට හේතු වූයේ
1. යක්ෂයාගේ බලපෑම්වලට හසු වීම ය.
2. ජුදාස්ගේ පාවාදීම කරණකොට ගෙන ය.
3. පේදුරුගේ අපලාපය කරණකොට ගෙන ය.
4. කෙබඳු මරණයකට ප්‍රාත්‍ර වන්නේදැයි කියාලත් පෙර දැනුම ය.
5. ස්වකීය කැමැත්තෙන්ම මරණයට කැප වූ නිසා ය.

(23) තමන් වහන්සේට විරුද්ධව කළ චෝදනා වලදී ජේසුස් වහන්සේ නිහඬව සිටියේ
1. වරද භාරගැනීමට සිදුවන බැවිනි.
2. පිලාත් ඉදිරියේ කථා කිරීම නොවැදගත් බැවිනි.
3. අභියෝග හමුවේ නොසැලී සිටිය යුතු බැවිනි.
4. කථා කිරීමෙන් නිදහස ලබා ගත නොහැකි බැවිනි.
5. නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට වඩා දේව කැමැත්තට අවනත වීම වැදගත් බැවිනි.

(24) ක්‍රිස්තුන් වහන්සේ ගේ කුරුසිගත වීමදී රට පුරා අන්ධකාරයක් පැවතීම දේවබල ප්‍රකාශනයක් ලෙසින් දක්වන්නේ
1. එළියා දිවැසිවරයා ය.
2. යෙසායා දිවැසිවරයා ය.
3. ජෙරමියා දිවැසිවරයා ය.
4. ආමොස් දිවැසිවරයා ය.
5. එසකියල් දිවැසිවරයා ය.

(25) "කඩුව කොපුවේ දමා ගන්න" යන්න ජේසුස් වහන්සේ කළ ප්‍රකාශයෙන් අදහස් කරන්නේ
1. හේවායන්ට කීකරු විය යුතු බවයි.
2. එය ජුදා සම්ප්‍රදාය බවයි.
3. උන්වහන්සේ ලෞකික බලයෙන් නොව දෙවියන් වහන්සේගේ බලයෙන් සන්නද්ධව සිටින බවයි.
4. ලෞකික කැමැත්තට ස්වකීය අකමැත්තෙන් වුවද නතුවන බවයි.
5. ප්‍රශ්න හමුවේ ක්‍රිස්තුන් වහන්සේ සන්සුන්ව සිටින බවයි.

(26) "අන්තිම දවසේ දී සියල්ලන් මත මම මාගේ ආත්මය වගුරුවන්නෙමි" මෙම ප්‍රකාශය කළේ
1. ක්‍රිස්තුන් වහන්සේ ය.
2. ආමොස් දිවැසිවරයා ය.
3. පාවුළු තුමා ය.
4. යෙසායා දිවැසිවරයා ය.
5. ජෝවෙල් දිවැසිවරයා ය.

(27) පාවුළු තුමාගේ ප්‍රථම ධර්ම දූත චාරිකාවට සහභාගී වූ සහයකයන් දෙදෙනා
1. බර්ණබස් හා සීලස් ය.
2. සීලස් හා තිමෝති ය.
3. තිමෝති හා තීතස් ය.
4. බර්ණබස් හා ජෝන්මාක් ය.
5. සීලස් හා ලූක් ය.

(28) "කාරිස්" යන ග්‍රීක වදනේ අර්ථය
1. ව්‍යවස්ථාවයි. 2. දයාවයි. 3. දේවරාජ්‍යයයි. 4. ගැලවීමයි. 5. ස්වරූපයයි.

(29) "ප්‍රාණපරිත්‍යාගීන්ගේ රුධිරය කිතුදහමේ බීජයයි". මෙම ප්‍රකාශය කළ සභා පියවරයා වන්නේ,

1. ජෙරොම් තුමා ය.
2. ජෝන් ක්‍රිසොස්තම් තුමා ය.
3. ග්‍රෙගරි තුමා ය.
4. අගුස්තීනු තුමා ය.
5. ටර්ටූලියන් තුමා ය.

(30) තර්කවේදීන් අතර ශ්‍රේෂ්ඨතම තර්කවේදියා ලෙස හැඳින්වෙන්නේ

1. ජස්ටින් තුමා ය.
2. අතනේසියස් තුමා ය.
3. ජෙරොම් තුමා ය.
4. සිරිල් තුමා ය.
5. අගුස්තිනු තුමා ය.

(31) ලූතර්ගේ ප්‍රොතෙස්තන්ත්‍ර රෙප්‍රමාදු ප්‍රගමනයට නායකත්වය දෙන්නට ඉදිරිපත් වූයේ

1. ස්විංග්ලි ය.
2. ජෝන් කැල්වින් ය.
3. ජොන් නොක්ස් ය.
4. මේරි ටියුඩර් ය.
5. තෝමස් මුවර් ය.

(32) කාන්තාවන් අපෝස්තලික සේවාවේ නියැලීම සඳහා ඇරඹුණු ලැබූ ප්‍රථම නිකාය වන්නේ

1. දයාවේ සොයුරියන්ගේ නිකාය යි.
2. කාර්මෙල් නිකායයි.
3. නිර්මල මරිය නිකායයි.
4. යහපත් එඬේරාගේ නිකායයි.
5. සුරදූතික නිකායයි.

(33) මාටින් ලූතර් විසින් සභාවේ ක්‍රියා හෙළි කරමින් ප්‍රකාශයට පත් කළ මූලික න්‍යායන් ගණන

1. 65 කි.
2. 70 කි.
3. 85 කි.
4. 90 කි.
5. 95 කි.

(34) 1902 රෝමයේ ශුද්ධ බයිබලීය කොමිෂම ස්ථාපනය කළේ

1. 11 ව පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
2. 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
3. 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
4. 2 වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා ය.
5. 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා ය.

(35) මුල් කිතුනුවන් භාවිතා කළ කැටකුම් චිත්‍රවල එන "පරවියා" ගෙන් සංකේතවත් කරන්නේ

1. ක්‍රිස්තුන් වහන්සේ ය.
2. ආත්මය ය.
3. සදාකාලිකත්වය ය.
4. යහපත් එඬේරා ය.
5. යව්ඥාව හා දෙවියන් වහන්සේ සමග ඇති සම්බන්ධතාවය ය.

(36) තම බලය තහවුරු කර ගැනීමට පෘතුගීසීන් සහය පැතුවේ

1. විජයබාහු රජතුමාගෙන් ය.
2. VII වන බුවනෙකබාහු රජතුමාගෙන් ය.
3. නරේන්ද්‍රසිංහ රජතුමාගෙන් ය.
4. මායාදුන්නෙ රජතුමාගෙන් ය.
5. ධර්මපාල රජතුමාගෙන් ය.

(37) පෘතුගීසීන් ලංකාවට පැමිණෙන කාලයේ මෙරට තිබූ ප්‍රධාන රාජ්‍ය තුන නම්

1. කෝට්ටේ, කන්ද උඩරට, හා රුහුණ ය.
2. කෝට්ටේ, යාපනය හා මන්නාරම ය.
3. කෝට්ටේ, කන්ද උඩරට හා වෙල්ලස්ස ය.
4. කෝට්ටේ, රුහුණු හා වෙල්ලස්ස ය.
5. කෝට්ටේ, කන්ද උඩරට හා යාපනය ය.

(38) ක්‍රි.ව. 1806 දී තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරයා මෙරට ඉතිහාසයේ වැදගත් තීරණයක් ගත් බ්‍රිතාන්‍ය පාලකයෙකු වශයෙන් හැඳින්වීමට හේතු වන්නේ

1. කතෝලිකයින්ට විරුද්ධව පනවා තිබූ ලන්දේසි නීති අවලංගු කිරීම ය.
2. මෙතෙක් ක්‍රියාත්මක නොවූ මානව අයිතීන් ස්ථාවර කිරීම ය.
3. උඩරට පහතරට වශයෙන් සිංහලයන් දෙකොටසක් ඇති බව පිළිගැනීම ය.
4. ක්‍රිස්තියානි ධර්මදූතයිනට මෙරටට පැමිණීමට ඉඩදීම ය.
5. මුහුදුබඩ ක්‍රියාත්මක වූ බදු ක්‍රම ඉවත් කිරීම ය.

(39) තෝම්බු ක්‍රමය මෙරට නොකඩවා පවත්වාගෙන ගියේ

1. සිංහල රජවරුන් ය.
2. බ්‍රිතාන්‍යයන් ය.
3. පෘතුගීසීන් ය.
4. ඉස්ලාමීන් ය.
5. ලන්දේසීන් ය.

(40) ඇමරිකන් ධර්මදූයන්ගේ අධ්‍යාපන සේවාවන් වඩාත් ව්‍යාප්ත වූයේ

1. යාපනය ප්‍රදේශයේ ය.
2. කොළඹ ප්‍රදේශයේ ය.
3. රුහුණු ප්‍රදේශයේ ය.
4. මහනුවර ප්‍රදේශයේ ය.
5. මඩකලපුව ප්‍රදේශයේ ය.

(41) ජේසුස් වහන්සේ "මූලික ප්‍රාථමික සක්‍රමේන්තුව" බව ප්‍රකාශ කරනුයේ

1. එඩ්වඩ් ස්කිලබෙක්ස් ය.
2. තෝමස් ඇක්වයිනස් තුමා ය.
3. ජුලියන් වෙල්හවුසන් ය.
4. ශුද්ධ වූ සිප්‍රියන් තුමා ය.
5. ෆිම්රාන් නැමැත්තා ය.

(42) "ඔබගේ තේජශ්‍රීයේදී අපෙන් එක්කෙනකුට ඔබගේ දකුණු පසද එක්කෙනකුට වම් පස ද හිඳගන්නට වර දුන මැනව" මෙසේ ඉල්ලීමක් කරනු ලැබුවේ

1. සීමොන් පේදුරු හා ඇන්ඩෘ ය.
2. පෝසත් තරුණයා ය.
3. මාර්තා හා මරියා ය.
4. තෝමස් ය.
5. ජාකොබ් හා ජොහාන් ය.

(43) වර්තමාන කිතුනු ජනවන්දනාවට බලපෑ පැරණි පිළිවෙත් කීපයක් පහත දැක්වේ.

(A) සර්ව රාත්‍රික බෞතිස්මය
(B) පුප කැඩීමේ පිළිවෙත
(C) හත් දින සතිය
(D) යකුන් දුරු කිරීම
(E) විශ්වාසීන්ගේ යැදුම

ඒවායින් ජුදා මුලාශ්‍ර වලට පමණක් අයත් වන්නේ

1. A, B හා C ය.
2. B, C හා E ය.
3. A, C හා D ය.
4. A, C හා E ය.
5. B, C හා D ය.

(44) ක්‍රිස්තුස් වහන්සේගේ පූජක කාර්යය පිළිබඳව අපට මතක් කරනු ලබන ලිපිය වන්නේ

1. එපීස ය. 2. හේබ්‍රෙව් ය. 3. ගලාති ය. 4. රෝම ය. 5. පිලිප්පි ය.

45) මාක් හා මතෙව් සුවිශේෂ වලට අනුව ජේසු සමිඳුන් රොටි හා කුසලාන මත පවසනුයේ ආශිර්වාදයකි. මෙය,

1. පලස්තීන සම්ප්‍රදායයි.
2. අසිරියානු සම්ප්‍රදායයි.
3. ග්‍රීක සම්ප්‍රදායයි.
4. ඇලෙක්සැන්ඩ්‍රියානු සම්ප්‍රදායයි.
5. රෝමානු සම්ප්‍රදායයි.

(46) මනුෂ්‍යත්වයේ උසස් බව හා එම උසස් බව රැකිය යුතු අයුරු අවධාරණය කරන දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ ව්‍යවස්ථාව වන්නේ

1. ගැළවුම්කරුවාණන්ගේ දහම් දූත සේවය ය.
2. වෙහෙසෙන මිනිසුන් ය.
3. දෙවියන් වහන්සේ ප්‍රේමය ය.
4. සුපුවතේ ආනන්දය ය.
5. වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව ය.

(47) ශුද්ධ වූ පාවුළු තුමා "ක්‍රිස්තුස් වහන්සේ තුළ ස්ත්‍රී පුරුෂ භේදයක්වත් නැත" යනුවෙන් උපදෙස් දෙනුයේ ............... සංඝයටය. මෙහි හිස් තැනට සුදුසු පිළිතුර තෝරන්න.

1. කොරින්ති 2. එපීස 3. ගලාති 4. කොලොස්සි 5. පිලිප්පි

(48) හෙබ්‍රෙව් බසින් "ෂාලොම්" යනුවෙන් හඳුන්වනුයේ

1. සාමයයි.
2. බැහැපත්කමයි.
3. ප්‍රේමයයි.
4. ධර්මිෂ්ඨකමයි.
5. ගැලවීමයි.

(49) ලංකා සභාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රාජගුරු පදවි දෙක වන්නේ

1. කොළඹ හා මාතර ය.
2. ගම්පහ හා අනුරාධපුරය ය.
3. පුත්තලම හා කුරුණෑගල ය.
4. කොළඹ හා කුරුණෑගල ය.
5. ගාල්ල හා අම්පාර ය.

(50) ශ්‍රී ලංකාවේ පැරණිතම ප්‍රොතෙස්තන්ත්‍ර සභාව වන්නේ

1. ප්‍රෙස්බිටේරියන් සභාවයි.
2. ක්‍රිස්තියානි රෙපරමාදු සභාවයි.
3. මෙතෝදිස්ත සභාවයි.
4. දකුණු ඉන්දියානු සභාවයි.
5. බැප්ටිස්ට් සභාවයි.